**යාපනය මහා නගර සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

යාපනය මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට යාපනය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනයෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඉකුත් වර්ෂ වල ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය වෙනුවෙන් වැයකල ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම රු. 153,773,505 ක වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | සභාවේ ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා එහි වටිනාකම තක්සේරු කරනමෙන් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇතත්, එම දෙපාර්තමේන්තුවෙන් තක්සේරුකර තක්සේරු වටිනාකම මෙතෙක් අප වෙත ලැබී නොමැති බැවින් ඉකුත් සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ LDSP මූල්‍ය ආධාර යටතේ සංවර්ධන වැඩ 03 ක් සඳහා වැයකල රු. 7,031,213 ක් ප්‍රාග්ධනිතකර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීම අඩුවෙන් දක්වා තිබුණි. | සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරුකර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් යටතේ ඇතුලත් කර නොතිබූ අතර, මෙසේ නිවැරදි කරන ලද ප්‍රාග්ධන සංවර්ධන වැඩ 2022 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි ඇතුලත් කරනු ලැබේ. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදී නොගත් භාණ්ඩ අයිතම් 8 ක්, ඉටුනොකල වාහන අළුත්වැඩියාවන් 18 ක් සහ ඉදිකිරීම් නොකල වැඩ 78 ක් සඳහා ගෙවීම් වවුචර පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වියදම් සහ ජංගම වගකීම රු. 135,021,292 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි අදාල කාල පරිච්ඡේදයතුල වැඩ ඉටු කිරීමට කටයුතු කරනු ලැබේ. | සිදුනොකල ගනුදෙනුවල වටිනාකම් ගිණුම්ගත නොකළ යුතුය. |
| (ඈ) | ජල සහ විදුලි අංශවල 2021 දෙසැම්බර් 31 දිනට රු. 2,337,669 ක් තොග වටිනාකම ගිණුම්ගත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් සහ ආදායම් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | වැය ශීර්ෂය යටතේ ඉල්ලුම් කර ලබා ගන්නා භාණ්ඩ අදාල වර්ෂයේම වැයකරන ක්‍රමයක් මෙතෙක් අනුගමනය කර ඇත. 2022.09.01 සිට අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ භාණ්ඩ ලබා ගෙන වර්ෂ අවසානයේ නිසිපරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කර ඇත. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඉ) | 2020 වර්ෂයේදි සභා අරමුදලෙන් මිලදී ගත් පුස්තකාල පොත් 1378 ක් සහ සමාලෝචිත වර්ෂයේදි මිලදී ගත් පුස්තකාල පොත් 647 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල | සභා අරමුදලින් මිලදීගත් පුස්තකාල පොත් 1378 ක් සහ 647 ක් ප්‍රාග්ධනිත කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් නිවැරදි කළ යුතුය. |

වටිනාකම රු. 1,041,890 කින් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| වරිපනම් බදු ආරම්භක ශේෂය | 116,183,594 | කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | දැනට සභාවේ භාවිතා කරන මෘදුකාංග මගින් හිඟ මුදල් පිළිබද තොරතුරු වෙන්කර ලබා ගැනීමට නොහැක . ඉදිරියේදි එය වැඩිදියුණු කර .ඉදිරිපත් කරනු ලැබේ | මේ සම්බන්ධයෙන් ඵලදායීව කඩිනමින් කටුයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 571 | වසර 02 ඉක්මවූ රු.22,339,964 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විවිධ තැන්පත්වලින් රු. 66,461 ක් ආපසු ගෙවා ඇත. ඉතිරි මුදල නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි අනුව අදාල තැන්පත් සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.272,824,761 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.160,217,539 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>සභා බලප්‍රදේශයේ දේපළ 40346 ක් තිබුණද, දේපළ වල වටිනාකම වරිපනම් අයකිරීම් කළ හැකි දේපළ 2010 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබීමෙන් සභාවට ලැබිය යුතු වරිපනම් ආදායම් අහිමිවී තිබුණි. තවද, මහා නගර සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වෙනුවෙන් අයකළ යුතු රු. 140,874,328 ක් වටිනා හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණ විය. | දේපල තක්සේරු කිරීම සඳහා නගරාධිපති විසින් ප්‍රධාන තක්සේරු කරුගෙන් විමසා තිබූ අතර, කාර්ය මණ්ඩල ගිහයක් තිබෙන බැවිනුත් සභා සතු දේපල විශාල ප්‍රමාණයක් තිබෙන බැවිනුත් තක්සේරු කිරීමට නොහැකව ඇත. දේපල හිමිකරුවන් බහුතරයක් පිට පළාත්වල සහ විදේශවල වෙසන බැවිනුත් හිස් ඉඩම් සඳහා දේපළවල අයිතිකරුවන් හඳුනා ගැනීමට නොහැකිව ඇත. | ආදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | **බදු කුලී**<br>රු. 7,201,257 ක් වටිනා හිඟ බදු කුලී වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | හිඟ බදු කුලී අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර ඇත. | අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම කඩිනම් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහ නගර සභා ආඥා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහ නගර සභා අතුරු ව්‍යවස්ථාවේ 4 වන පරිච්ඡේදයේ (එ) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ සවිකර තිබූ දැන්වීම් පුවරු බලපත්‍ර සඳහා ගාස්තු අයකර ගතයුතුවූවත් දැන්වීම් පුවරු 15 කින් ගාස්තු අයකරගෙන නොමැති බව 2022 මාර්තු 15 දින ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණ විය. මෙමගින් රු. 1,229,160 කින් 2021 වර්ෂයේ ආදයම් අහිමිවී තිබුණි. | අදාල දැන්වීම් පුවරු ගාස්තු සම්බන්ධයෙන් 2021 වර්ෂයේ පළමුවෙනි සහ දෙවෙනි දැනුවත් කිරීම් යවා ඇත. රු. 596,925 ක මුදලක් අයකර ඇති අතර, ඉතිරි මුදල අයකිරීම් සඳහා ආදායම් පරීක්ෂකවරුන්ට විස්තර ලබා දී ඇත. | අදාල නීති ප්‍රතිපාදනය අනුව කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් වාර්ෂිකව ටෙන්ඩර් කැඳවා ලබා දෙන පොළවල් සහ කඩකාමර සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කැඳවා බඳුදී නොතිබීමෙන් වාර්ෂිකව රු. 5,076,019 ක ආදායමක් අහිමිවී තිබුණි. | අදාල කරුණු සම්බන්ධයෙන් ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමන කර ඇතත්, පොළවල් සහ මස්කඩ බදු දීමේදි, ලබා ගැනීමට කිසිවෙක් ඉදිරිපත් නොවීමෙන් සභාවට ආදායම් අහිමිවීමක් සිදුවී ඇත. | සභාවේ වත්කම්වලින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදි වාහන 07 ක් වර්ෂ 2 කට අධික කාලයක් අළුත්වැඩියා කළ නොහැකි තත්වයේ පැවති වාහන 07ක් සමාලෝචිත වර්ෂයේදී ගර්හිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉන්ජිනේරුවරයාගේ අනුමැතියක් ලබා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය. | විගණන විමසුමට අදාල පිළිතුරු මාගේ සමාංක හා 2022.07.25 දින ලිපියෙන් ඔබ වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රතිපාදනය අනුව කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | මහ නගර සභාව විසින් ඉකුත් වර්ෂ පහක කාලය සිට නොපියවු රු. 5,358,866 ක අත්තිකාරම් මුදල් වලට අදාල ලියවිලි විනාශවී ඇතත්, ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වර්ෂ 05කට අධික කාලයක් නිරවුල් නොකරන ලද අත්තිකාරම් රු. 5,358,866 ක මුදල පියවීම සම්බන්ධයෙන් ගරු. ආණ්ඩුකාරතුමා වෙත අනුමැතිය සඳහා 2021.11.11 දින ලිපි යවා ඇති අතර, ආණ්ඩුකාරවරයාගෙන් 2022.08.06 දින අඩුපාඩු සඳහන් කර ලියවිලි කීපයක් ඉල්ලා ඇත. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කෙරෙමින් පවති. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **භාර නොගත් වත්කම්**<br>සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 51 ක වටිනාකම තක්සේරුකර මුල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | සභාව සතු වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් 45 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | ඉඩම් පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සේවක ණය**<br>සභාව විසින් සෙවයෙන් ඉවත්කර තිබූ, වැටුප් ගෙවීම අත්හිටවන ලද සහ විශ්‍රාම ගිය නිලධාරීන් 154 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ සේවක ණය ශේෂය රු. 933,643 ක් ආපදා ණය, උත්සව අත්තිකාරම් සහ විශේෂ අත්තිකාරම් වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, සභාව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට අවශ්‍යා කටයුතු කෙරමින් පවති. | හිඟ ණය ශේෂය අදාල කාල පරිච්ඡේදයතුල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |